ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව.
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: **dcommunications@cbsl.lk, communications@cbsl.lk**
වෙබ් අඩවිය: **www.cbsl.gov.lk**

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| **නිකුත් කළේ** | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2019 ජනවාරි 16 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2018 දෙසැම්බර්

**නිෂ්පාදන ක්‍රියාකාරකම් අඩු වේගයකින් වර්ධනය වීම** සඳහා නොවැම්බර් මාසයට සාපේක්ෂව දෙසැම්බර් මාසයේදී, නිමි ඇඳුම් නිෂ්පාදන අංශයේ රැකියා නියුක්තියෙහි සහ නිෂ්පාදනයෙහි දක්නට ලැබුණු මන්දගාමීත්වය හේතු විය. වඩා හොඳ වැටුප් සහිත උත්සව සමයේ තාවකාලික රැකියා සඳහා සමහර සේවකයින් යොමු වීම, රැකියා නියුක්තියෙහි සැළකිය යුතු අඩුවීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. නිෂ්පාදනයෙහි ඇතිවූ අඩුවීම කෙරෙහිද මෙමගින් බලපෑමක් ඇතිවිය. කෙසේ වුවද, උත්සව සමයෙහි ඉල්ලුම අඛණ්ඩව පැවතීම හේතුවෙන් ආහාර සහ පාන අංශයෙහි නව ඇණවුම් වල වර්ධනයක් දක්නට ලැබුණි.


| විචල්‍යය | නොවැ. | දෙසැ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **54.3** | **53.7** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උප දර්ශක** | | |
| නව ඇණවුම් | 54.0 | 57.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 54.0 | 51.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 55.0 | 46.5 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| ගැනුම් තොගය | 57.5 | 60.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 52.5 | 55.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මේ අතර, එළඹෙන චීන නව අවුරුදු උත්සවය සමග ඇතිවිය හැකි සැපයුම් බාධා සැලකිල්ලට ගනිමින් ඉදිරි නිෂ්පාදන අවශ්‍යතා සඳහා අවශ්‍ය තොග මිලදී ගැනීම හේතුවෙන් ගැනුම් තොග ඉහළ වේගයකින් වර්ධනය විය. මේ සමඟම සැපයුම්කරුවන්ගේ සැපයුම් කාලය ද දිගු විය.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි රැකියා නියුක්තිය හැර අනෙකුත් සියලුම උප දර්ශක, කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කළද, 2018 නොවැම්බර් මාසයට සාපේක්ෂව නිෂ්පාදන ක්‍රියාකාරකම් අඩු වේගයකින් වර්ධනය වූ බව පෙන්නුම් කරයි.

| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය | නොවැම්බර් මාසයට සාපේක්ෂව දර්ශක 0.6 ක අඩුවීමකි. |
|---|---|
| **53.7** | |

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




**ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, නොවැම්බර් මාසයට සාපේක්ෂව දර්ශක අගයන් 0.6 කින් පහත වැටෙමින් දෙසැම්බර් මාසයේදී 53.7 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

2018 දෙසැම්බර් මාසයේදී, යුරෝපා කලාපය , එක්සත් ජනපදය, චීනය, ඉන්දියාව සහ රුසියාව නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයන්හි අඩුවීමක් පෙන්නුම් කළ අතර එක්සත් රාජධානිය වර්ධනයක් පෙන්නුම් කරන ලදී.
*(මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2019 ජනවාරි 14 වන දිනට)*

[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමගින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් *30* කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.

**2018 දෙසැම්බර් මාසයේ දී සේවා අංශය ඉහළ වේගයකින් වර්ධනය** වූ අතර ව්‍යාපාර ක්‍රියාකාරකම්, අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ නව ව්‍යාපාරවල සිදු වූ ඉහළ යෑම ඊට හේතු විය.

උත්සව සමය සහ සංචාරකයන් වැඩි වශයෙන් මෙරටට පැමිණෙන කාලය වීම හේතුවෙන් තොග සහ සිල්ලර වෙළඳාම සහ නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවා යන උප අංශවල ඉහළ වර්ධනයක් වාර්තා වූ හෙයින් ව්‍යාපාර ක්‍රියාකාරකම් උප දර්ශකය මාස දහයකින් වාර්තා වූ ඉහළම අගය දෙසැම්බර් මාසයේ දී වාර්තා විය. ප්‍රතිනැවිගත කිරීම් ප්‍රමාණයේ වර්ධනයත් සමඟ භාණ්ඩ ප්‍රවාහනයෙහි වර්ධනයක් වාර්තා වූ අතර නිවාඩු සමය සමඟ විවේක ක්‍රියාකාරකම් වැනි වෙනත් පෞද්ගලික සේවාවන් ද වර්ධනය විය. හිතකර ඉල්ලුම් තත්ත්වයන් හේතුවෙන් මූල්‍ය සේවා, රක්ෂණ සහ වෘත්තීය සේවාවන්හි නව ව්‍යාපාරවල වර්ධනයක් දැකිය හැකි විය.

| විචල්‍යය | නොවැ. | දෙසැ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **52.6** | **54.7** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| | | <u>**උප දර්ශක**</u> | | |
| නව ව්‍යාපාර | 53.4 | 55.4 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 57.4 | 64.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 52.3 | 44.1 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 44.6 | 47.2 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 55.1 | 62.4 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

පුරප්පාඩු සඳහා නව බඳවා ගැනීම් ප්‍රමාද වීම හේතුවෙන් ව්‍යාපාර ක්‍රියාකාරකම්වල ඉහළ වර්ධනයක් තිබුණ ද දෙසැම්බර් මාසයේ දී බොහෝ අංශවල සේවා නියුක්තිය පහළ ගියේය.


රුපියල අවප්‍රමාණය වීම සහ මෑත කාලීනව සිදු කළ පොලී අනුපාත ඉහළ දැමීම හේතුවෙන් සේවා අංශයේ අයකරන මිල ගණන් ඉහළ යන ලද අතර දෙසැම්බර් මාසයේ දී සේවා අංශයේ අපේක්ෂිත ශ්‍රම පිරිවැය අඩු වේගයකින් ඉහළ ගියේය.

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**54.7**

**නොවැම්බර් මාසයට සාපේක්ෂව දර්ශක 2.1 ක වැඩි වීමකි.**

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




**ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය**

ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය නොවැම්බර් මාසයේ දී සිව් මසකින් වාර්තා වූ ඉහළම අගය වන 53.7 හි සිට 2018 දෙසැම්බර් මාසයේ දී 53.1 දක්වා පහළ ගිය අතර පසුගිය මාස 113 තුළ වර්ධනයක් පෙන්නුම් කරයි.

ජපානය, චීනය, එක්සත් රාජධානිය, ඉන්දියාව සහ ඇමරිකා එක්සත් ජනපදය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ නොවැම්බර් මාසයට සාපේක්ෂව දෙසැම්බර් මාසයේ දී වර්ධනය වූ බව පෙන්නුම් කරයි.

*(මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2019 ජනවාරි 14 වන දිනට)*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

***නියැදිය***

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍යය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.